නුඹලා තවලම් (මගී වෙළඳුන් අතරමග) හමු නොවනු. නුඹලා අතුරින් ඇතැමෙක් ඇතැමුන්ට එරෙහිව ගනුදෙනු නොකරනු. අනෙකාට පාඩුවන අයුරින් මිල ඉහළ නොදමනු. පදිංචිව සිටින කෙනෙකු පිටස්තරයකුට නොවිකුණනු. ඔටුවන් හා එළුවන්ගේ තන බුරුල්ල ගෙට නොගසනු.

නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා පැවසූ බව අබූ හුරෙය්රා -රළියල්ලාහු අන්හු-
තුමා විසින් වාර්තා කරන ලදී. “නුඹලා තවලම් (මගී වෙළඳුන් අතර මග) හමු නොවනු. නුඹලා අතුරින් ඇතැමෙක් ඇතැමුන්ට එරෙහිව ගනුදෙනු නොකරනු. අනෙකාට පාඩුවන අයුරින් මිල ඉහළ නොදමනු. පදිංචිව සිටින කෙනෙකු පිටස්තරයකුට නොවිකුණනු. ඔටුවන් හා එළුවන්ගේ තන් බුරුල්ල ගෙට නොගසනු. කවරෙකු එය විකුණන්නේද එහි කිරි දෙවීමෙන් පසුව දෙකින් එකක් තෝරා ගත හැක. එනම්: එය ගැන තෘප්තිමත් වන්නේ නම් එය තබා ගත හැක. ඒ ගැන පිළිකුල්
කරන්නේ නම් රට ඉඳිවලින් සාඃ එකක ප්රමාණයක් සමග එය නැවත භාර දිය හැක.
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත - බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

තහනම් ව්යාපාර වර්ග පහකින් නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වැළැක්වූහ. හේතුව ඒවා මගින් ව්යාපාරිකයාට හෝ පාරිභෝගිකයාට හෝ ඒ දෙදෙනාටම හෝ පීඩාකාරී තත්ත්වයන් උදාවන බැවිනි. 1. ආහාර හා සත්වයින් විකිණීම සඳහා පැමිණෙන වෙළඳුන් මඟදී හමුවී ඔවුන් වෙළඳපොළට යාමට පෙර ඔවුන්ගෙන් ඒවා මිලදී ගැනීම තහනම් කර ඇත්තාහ. හේතුව ඔවුන් එහි නියම වටිනාකම නොදනී. ඒ හේතුවෙන් ඇතැම් විට ඔවුන් මුළාවට පත්වනු ඇත. තවද එ් ගැන අවශ්යතාවෙන් පසුවන ජනයාගේ ඉතිරි ආහාර වේල ඔවුනට තහනම් වී යනු ඇත. 2. කිසිවකුගේ ව්යාපාරයට එරෙහිව ව්යාපාර කිරීම තහනම් මෙන්ම මිලට ගන්නාට එරෙහිව මිලට ගැනීමද එලෙසමය. එය තෝරා ගැනීමේ නිදහස ඇති භූමිකාවක හෝ එකඟතාවේ කොන්දේසිය අතරවාරයේ හෝ තවත් ව්යාපාරිකයකු ඔහු දෙස බලා ඔබ මිලදී ගන්නේ නම් මෙම භාණ්ඩයට වඩා යහපත් භාණ්ඩයක් හෝ මෙම වටිනාකමට වඩා සහන මිලක් මම ඔබට පිරිනමමි. එසේ නැතිනම් ඔබ විකුණන්නේ නම් මම ඔබෙන් මෙය අධික වටිනාකමකට මිලදී ගනිමි. යැයි පවසා සිටීමය එය (කළින් කළ) ව්යාපාරය අවලංගු කොට නව ව්යාපාරිකයා සමග ගිවිසුම ඇති කර ගැනීමය. එලෙසය තෝරා ගැනීමෙන් පසුව සිදුවුවද එය තහනම්ය. හේතුව මෙම ඇඟිලි ගැසීම අවිනිශ්චිතභාවයට සතුරුකමට හා ක්රෝධයට හේතු වන්නේය. එමෙන්ම තම සහෝදරයාට ලැබිය යුතු දෑ අහිමි කර දැමීමකි. 3. පසුව නජ්ස් හෙවත් මිලදී ගැනීමේ අපේක්ෂාවෙන් තොරව භාණ්ඩයේ මිල අධික කිරීමෙන් එතුමා වැළැක්වූහ. සැබැවින්ම එය ව්යාපාරිකයාට මිල අධික කිරීමෙන් ප්රයෝජනය ගෙන දෙයි, එසේ නැතිනම් භාණ්ඩයේ මිල ඉහළ නැංවීමෙන් පාරිභොගිකයා පීඩාවට පත් වේ. එහිදී පාරිභෝගිකාට බොරු හා වංචා සිදු වේ. කුමන්ත්රණ හා වංචා සහගත ලෙසින් භාණ්ඩයේ මිල අධික වේ. 4. පදිංචිව සිටින කෙනෙකු තම භාණ්ඩ පිටස්තරයකුට විකිණීමෙන් තහනම් කළහ. හේතුව එහි මිල සීමා කර ඇති බැවිනි. එවිට දේශීය පාරාභෝගික ජනයාට ප්රයෝජන ලබන කිසිවක් ඉතිරි නොවනු ඇත. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා මෙසේ පැවසූහ. “නුඹලා ජනයා අතහැර දමනු. ඔවුන්ගෙන් ඇතැමෙකු විසින් ඇතැමෙකුට අල්ලාහ් පෝෂණය සලසන්නේය.“ 5. තන් බුරුල්ල බදින ලද ගොවිපල සතුන් විකිණීමෙන්ද එතුමා තහනම් කළහ. එවිට මිලදී ගන්නා පාරිභෝගිකයා උගේ සුපුරුදු පෙනුම මෙය යැයි සිතා එහි නියම

වටිනාකමට වඩා අධික මිලට එය මිලදී ගනී. එය පාරිභෝගිකයාට කරන වංචාවකි, අපරාධයකි. ඔහුගේ මෙම අසාධාරණය සඳහා දින තුනක කාලයක් දහම විසින් නියම කොට ඇත. එහිදී ඔහු එය ගැන තෘප්තිමත් වන්නේ නම් එය තබා ගත හැක. එමෙන්ම තන් ගෙට ගසා ඇති බවට දැනගත් පසු නැවත ව්යාපාරිකයාට භාරදීමේ නිදහසද ඔහුට ඇත. ඔහු එයින් කිරි දොවා ඇත්නම් ඒ වෙනුවට රට ඉඳිවලින් සාඃ එකක ප්රමාණයක් සමග එය නැවත භාර දිය යුතුය.

http://www.sunnah.global/hadeeth/si/show/5918